# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,451 - 2006 ජුනි 23 වැනි සිකුරාදා - 2006.06.23

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 764 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 764 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 767 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 767 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජුනි මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 ජුනි මස 16 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර

### ආරක්ෂක සේවාවන් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම් විසින් එම කාර්යාල ගොඩනැගිල්ලට 2007.08.01 දින සිට ආරක්ෂක සේවාවන් සැපයීම සඳහා සුදුසුකම් ලත් ආයතනවලින් මිළ ගණන් කැඳවනු ලැබේ.

02. 2007.06.26 දිනට පෙර පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති ආයතන විසින් සම්පූර්ණ කළ යුතු ටෙන්ඩර් ආකෘති පත්‍ර කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී වෙතින් සාමාන්‍ය රාජකාරී වේලාවන් තුළදී ආපසු නොගෙවන රු. 250 ක ගාස්තු ගෙවා ලබාගත හැකිය.

(i) රජයේ හෝ දෙපාර්තමේන්තු වලට ආරක්ෂක සේවාවන් සපයන ආයතනයන් වශයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතනයන් විය යුතුය.

(ii) පසුගිය වසර 05 තුළදී මාසයකට එක් ආයතනයක රුපියල් ලක්ෂයක් හෝ ඊට වැඩි වටිනාකමට එවැනි සේවාවන් සතුටුදායක ලෙස කර ඇති සහ දැනටමත් එවැනි සේවාවන්හි යෙදී සිටින ආයතනයක් විය යුතුය. (ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය)

(iii) අවම වශයෙන් සිය දෙනෙකුගෙන් සමන්විත පුහුණු වූ පළපුරුදු ශ්‍රී ලාංකික ආරක්ෂක කාර්ය මණ්ඩලයක් සිටිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් අර්ථසාධක අරමුදල් ලිපිලේඛන හා වෙනත් ලියකියවිලි මගින් සාධක ඉදිරිපත් කළ යුතුය.

(iv) වයස අවුරුදු 20-60 ත් අතර වූ යහපත් කාල බලයක් ඇති ගිනි නිවීමේ සේවා සහ ගිනි අවි භාවිතයෙහි සතුටුදායක පළපුරුද්දක් සහිත කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය.

(v) මූල්‍ය ස්ථාවරත්වය සනාථ කිරීම සඳහා බැංකු යොමුව සහිතව සාධක ඉදිරිපත් කළ යුතුය.

03. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2007.07.12 දින ප. ව. 3.00ට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ දෙපිටපතකින් යුතුව ලියාපදිංචි තැපෑලෙන් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම් වෙත එවීමට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතිරේක දිස්ත්‍රික් ලේකම් කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමටද පුළුවන. ටෙන්ඩර් විවෘත කිරීම 2005.07.12 දින ප.ව. 3.05 ට මෙම කාර්යාලයේදී සිදුකෙරේ. ලියුම් කවරයේ ඉහළ "ආරක්ෂක සේවාවන් සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

එස්. හපුආරච්චි,<br>
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,<br>
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ, අතිරේක ලේකම්,<br>
කළුතර පරිපාලන දිස්ත්‍රික්කය.

2005 මැයි මස 29 දින,<br>
කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

06-526

---

# බඩු බාහිරාදිය විකිණීම්

## මහාධිකරණය - හලාවත

### අළුත්වැඩියාවෙන් පසු ඉවත් කරන ලද පැරණි ලී දඬු හා අබලි ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2006.07.22 වැනි සෙනසුරාදා පෙ. ව. 9.30 ට හලාවත මහාධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය පවත්වන දින පෙ. ව. 9.00 සිට 9.30 දක්වා අදාළ භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිලිනොගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියේදී මිලදී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ දී ම මුදලින් ගෙවීම් කළ යුතුය. මුදල් ඇණවුම්, චෙක්පත් භාර නොගන්නා අතර එදින පස්වරු 6.00 ප්‍රථම සියලුම භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගතයුතු වේ.

05. වෙන්දේසියේ දි භාණ්ඩ මිලදී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ ඒ සමාන ලියවිල්ලකින් තහවුරු කළ යුතුය.

එම්. සී. ජේ. මඩවල,<br>
වයඹ පළාතේ මහාධිකරණ විනිසුරු,<br>
මහාධිකරණය - හලාවත.

2006 මැයි මස 22 වැනි දින,<br>
හලාවත මහාධිකරණයේ දී ය.

#### උපලේඛනය

| *අනු අංකය* | *භාණ්ඩ පිලිබඳ විස්තරය* |
|---|---|
| 01. | රීප්ප දික් අඩි 1771ක් |
| 02. | අඩි 5. 6 x 2 . 6 දොර පියන් 01යි |
| 03. | අඩි 4 .10 x 2. 6 දොර පියන් 01යි (දිරාපත්ව ඇත) |
| 04. | අඩි 5.11x 2 . 7 දොරපියන් 01යි (භාවිතයට ගත නොහැකි ලෙස දිරා ඇත) |
| 05. | අඩි 6.2 x 1.7දැල් සහිත දොර පියන් 02යි |
| 06. | අඩි 3 7 x 1.6 වීදුරු ජනෙල් පියන් 01යි (දිරා ඇත) |

| අනු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|
| 07. | උස අඩි 6.9 x පළල 5.9 යකඩ කූරු සහිත ජනෙල් පියන් භාගයක් සමඟ ජනෙල් 01යි |
| 08. | දිග අඩි 3′ x 2.3″ දැල් කැලි 22යි (මළ බැඳී ඇත ) |
| 09. | දිග අඩි 10′.6″ x 2′.3″ දැල් කැලි 01යි |
| 10. | කම්බි කූරු සහිත ජනෙල් අඩි 5′.6″ x 6′ 01යි |
| 11. | අහල් 4 එස්ලෝන් බට දික් අඩි 206යි |
| 12. | අහල් 01 හා විවිධ ප්‍රමාණ බට දික් අඩි 73යි |
| 13. | අඩි 8 x 2 1/2 දිරා ගිය තහඩු 05යි |
| 14. | පොත් රාක්ක දිග අඩි 11.5 x 3 . .3 x 4.6 04යි |
| 15. | දිග අඩි 11x 1 1.6 x 7 පොත් රාක්ක 01යි (තරමක් දිරා ඇත) |
| 16. | දර යාර 03යි |
| 17. | දිග අඩි 16 1/2 මුල විශ්කම්භය අඩි 4යි. අග විශ්කම්භය 2.6 ඉන්දියන් විලෝ ගස් කඳන් 01යි |
| 18. | පුපුරා ගිය කොන්ක්‍රීට් කම්බි කණු 28යි |
| 19. | උඩට වීදුරු ගැසූ 5′.10″ x 5′.6″ පාටිෂන් රාමු 01යි |
| 20. | උඩට වීදුරු ගැසූ අඩි 3′ .6″ x 5′ .10″ පාටිෂන් රාමු 01යි (දැව දිරා ඇත) |
| 21. | වීදුරු පියන් රාමු අඩි 2′.1″ x 2′ .8″ 01යි |
| 22. | පැරණි අබලන් ගේට්ටු 01යි |
| 23. | කැඩුනු පුටු 13යි (කැබලි) |
| 24. | සිර මැදිරි (ප්‍රාථමික අධිකරණය - වෙන්නප්පුව) 01යි |
| 25. | සාක්ෂි කූඩු (ප්‍රාථමික අධිකරණය - වෙන්නප්පුව)01යි |
| 26. | විනිශ්චයාසනය (ප්‍රාථමික අධිකරණය - වෙන්නප්පුව)01යි |
| 27. | දිග අඩි 8 x 3 දිරා ගිය තහඩු 03යි |

06-494

---

## දඹුල්ල මහෙස්ත්‍රාත් අධිකරණය

දඹුල්ල මහෙස්ත්‍රාත් අධිකණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2006.07.16 වැනි ඉරු දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින පෙ. ව. 9.00 සිට පෙ. ව. 9.15 තෙක් භාණ්ඩ පරීක්ෂා කල හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමෙ සම්පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිළ දී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේම මුදල් ගෙවා එකී භාණ්ඩය අධිකරණ භූමියෙන් ඉවත්කරගත යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැණුම්කරු ඔහුගේ ජාතික හැඳුණුම්පත රැගෙන ආ යුතුය.

එච්. පී. ජී. එන්. රණවීර,
මහෙස්ත්‍රාත්,
දඹුල්ල.

2006 මැයි මස 30 වැනි දින,
දඹුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

වෙන්දේසිය-2006

| | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 1. | බී 203/2002 | අංක 0531243 හීරෝ පාපැදි 01 යි |
| 2. | -එම- | අංක 941894 ලුමාලා පාපැදි 01 යි |
| 3. | -එම- | අංක 55399132 ලුමාලා පාපැදි 01 යි |
| 4. | -එම- | අංක 4756183 හීරෝ පාපැදි 01 යි |
| 5. | -එම- | අංක 55722772 ස්පෝට් පාපැදි 01 යි |
| 6. | -එම- | අංක 11ජී 760 පයනිර් පාපැදි 01 යි |
| 7. | -එම- | අංක රහිත හම්බර් පාපැදි 01 යි |
| 8 | -එම- | අංක රහිත රැලේ පාපැදි 01 යි |
| 9. | -එම- | අංක රහිත හීරෝ පාපැදි 01 යි |
| 10. | -එම- | අංක රහිත හම්බර් පාපැදි 01 යි |
| 11. | -එම- | අංක රහිත හීරෝ පාපැදි 01 යි |
| 12. | -එම- | අංක රහිත ලුමාලා පාපැදි 01 යි |
| 13. | -එම- | අංක රහිත ස්පෝර්ට් වර්ගයේ පාපැදි 01 යි |
| 14. | -එම- | අංක රහිත මවුන්ටන් වර්ගයේ පාපැදි 01 යි |
| 15. | -එම- | අංක රහිත මවුන්ටන් වර්ගයේ පාපැදි 01 යි |
| 16. | -එම- | අංක රහිත හීරෝ වර්ගයේ පාපැදි 01 යි |
| 17. | -එම- | අංක රහිත ලුමාලා පාපැදි 01 යි |
| 18. | -එම- | අංක වර්ගය අපැහැදිලි පාපැදි 01 යි |
| 19. | -එම- | අංක රහිත සිංගර් පාපැදි 01 යි |
| 20. | -එම- | අංක රහිත එවෝන් වර්ගයේ පාපැදි 01 යි |
| 21. | -එම- | අංක රහිත වර්ගය අපැහැදිලි පාපැදි 01 යි |
| 22. | -එම- | අංක රහිත එච්ඕ 654 වර්ගය නොදනී පාපැදි 01 යි |
| 23. | -එම- | අංක රහිත ඒ. 46602 ලුමාලා පාපැදි 01 යි |
| 24. | 58646 | වර්ගය නොදනී පාපැදි 01 යි |
| 25. | 58645 | බී 78920 පාපැදි 01 යි |
| 26. | ඒ. ආර්. 604 | හීරෝ වර්ගයේ පාපැදි 01 යි |
| 27. | ඒ. ආර්. 240/05 | හීරෝ වර්ගයේ පාපැදි 01 යි |
| 28. | ඒ. ආර්. 603/05 | -එම- |
| 29. | ඒ. ආර්. 1472/05 | සුපර් ඔලිම්පියා පාපැදි 01 යි |
| 30. | අංක රහිත | පීසීඅයි-31294 පාපැදි 01 යි |
| 31. | ඒ. ආර්. 133/04 | හීරෝ වර්ගයේ පාපැදි 01 යි |
| 32. | අංක රහිත | ආර්එච්සී 13769 පාපැදි 01 යි |
| 33. | 48158 | බණ්ඩි කියත් 01 යි |
| 34. | 5932 | -එම- |
| 35. | 78519 | -එම- |
| 36. | 48183 | -එම- |
| 37. | අංක රහිත | -එම- |
| 38. | ඒ. ආර්. 1176/1 | ඉරුම් කියත් |
| 39. | ඒ. ආර්. 360 | ඉරුම් කියත් 01 යි |

| | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 40. | අංක රහිත | -එම- |
| 41. | අංක රහිත | ඉරුම් කියත් 01 යි |
| 42. | -එම- | -එම- |
| 43. | ඒ. ආර්.1157/02 | -එම- |
| 44. | ඒ. ආර්. 51/02 | -එම- |
| 45. | අංක රහිත | -එම- |
| 46. | අංක රහිත | සවල් තොගයක් |
| 47. | අංක රහිත | පුටු සෙට් 01 යි |
| 48. | අංක රහිත | කලුවර පුටු සෙට් 01 යි |
| 49. | අංක රහිත | ලොකු ගෑස් සිලින්ඩර් 01 යි (කේ. පි. 33) |
| 50. | අංක රහිත | ලී යතුගාන මැෂින් 01 යි (මෝටර්ය රහිත) |
| 51. | 91163 | ඔරලෝසු 01 යි |
| 52. | 73002, 73004 | ගෑස් ලිප් 02 යි |
| 53. | පී. ආර් 179/05 | පොඩි තරාදි 01 යි |
| 54. | පී. ආර්. 180/04 | බන්ඩිරි තරාදි 01 යි |
| 55. | පී. ආර්. 89/03 | පැනසොනික් කැසට් රේඩියෝ 01 යි |
| 56. | අංක රහිත | අකායි වර්ගයේ ඩෙක් 01 යි |
| 57. | බී 42/01 | අයිෂිබා තරාදි 01 යි |
| 58. | අංක රහිත | වී මෝල පටි 01 යි |
| 59. | ඒ. ආර්. 1393/00 | රිම් එක සහිත යතුරු පැදි ටයර් 02 යි |
| 60. | 53280 | තට්ටු තරාදි 01 යි |
| 61. | අංක රහිත | ලොරි ටයර් 01යි |
| 62. | අංක රහිත | රතු පාට ප්ලාස්ටික් පුටු 06 යි, විශාල සින්තා පැදුරු 01යි, පුටු කොට්ට 04යි |
| 63. | අංක රහිත | රිම් එක සහිත ලොරි ටයර් 01 යි |
| 64. | -එම- | අබලි යකඩ තොගයක් |
| 65. | -එම- | වාහන රිම් 01 යි |
| 66. | -එම- | වැසි අංක ටී 1103265<br>එන්ජින් අංක 110365<br>134-5616 හොණ්ඩා සී. ඩී. 125 යතුරු පැදිය |
| 67. | 57989 | වැසි අංක 0775300<br>එන්ජින් අංක 0749359 දරන සීසී 50<br>අංක සීඑච්ටී 0653 යතුරු පැදිය |
| 68. | බී 203/02 | වැසි අංක 1002486<br>එන්ජින් අංක 1002491<br>හොණ්ඩා සීඩී-125, 103-2704 යතුරු පැදිය |
| 69. | බී. 203/02 | වැසි අංක වී 50-194650<br>එන්ජින් අංකය 450-194650<br>අංක 135-3991 යතුරු පැදි 1 යි |
| 70. | බී 203/02 | වැසි අංකය-වී 50-361284<br>එන්ජින් අංකය වී 50-361284<br>අංක 132-1611 යතුරු පැදි 1 යි |
| 71. | බී 203/02 | වැසි අංකය-වී 50-3510323<br>එන්ජින් වී 50-351323<br>අංක 145-1166 යතුර පැදි 01 යි |
| 72. | බී 181/04 | වැසි අංක-17 ඩබ් 350279<br>එන්ජින් අංක-5ආර්2-350279<br>යමහා 50 සීසී යතුරු පැදිය |
| 73. | ඒ. ආර්. 1812/03 | වැසි අංක 125-බී-101 4889<br>එන්ජින් අංකය සී බී 125 ටීඊ-1014892<br>125-8989 හොණ්ඩා යතුරු පැදිය |
| 74. | අංක රහිත | වැසි අංකය සීඩී 125 කේ 2015075<br>එන්ජින් අංකය-සීඩී 125කේ-2015135<br>83-7018 හොණ්ඩා යතුරුපැදිය |
| 75. | අංක රහිත | වැසි අංකය-වී 90ටී 262170<br>එන්ජින් අංකය-වී 90ටී 262170<br>107-2974 යමහා යතුරුපැදිය |
| 76. | අංක රහිත | වැසි අංකය-එෆ්ආර් 50-740293<br>එන්ජින් අංකය-එෆ්ආර් 50-441312<br>සුසුකි වර්ගයේ යතුරු පැදි 1 යි |
| 77. | අංක රහිත | වැසි අංකය-සී 50-0870121<br>එන්ජින් අංකය-සී50-0826742<br>හොණ්ඩා වර්ගයේ යතුරුපැදි 01 යි |
| 78. | අංක රහිත | වැසි අංකය-සීඩබ් 12-4222<br>එන්ජින් අංකය-6735 සීපැන් වර්ගයේ<br>අත් ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 79. | 29595 | වැසි අංකය 173<br>එන්ජින් අංකය 1173 සන්ටෙක් වර්ගයේ අත් ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 80. | 73003 | කේ. ජී. 12.5 ගෑස් සිලින්ඩර් 01 යි |
| 81. | 73004 | කේ. ජී. 12.5 ගෑස් සිලින්ඩර් 01 යි<br>ගෑස් ලිප් 01 යි |
| 82. | බී 103/06 | අත් ට්‍රැක්ටර් ටේලර් 01 යි |
| 83. | බී. 103/06 | ඉරුම් පට්ටල් 03 යි |
| 84. | 70257 | අත් ට්‍රැක්ටර් ටේලර් 01 යි |
| 85. | 70257 | කියත සමග ඉරුම් පට්ටල් 02 යි |
| 86. | 78332 | අත් ට්‍රැක්ටර් ටේලර් 01 යි |
| 87. | 78332 | කියත සමග ඉරුම් පට්ටල් 01 යි |
| 88. | 74396 | අත් ට්‍රැක්ටර් ටේලර් 1 යි |
| 89. | 74396 | කියත සමග ඉරුම් පට්ටල් 1 යි |
| 90. | 75740 | අත් ට්‍රැක්ටර් ටේලර් 1 යි |
| 91. | 75740 | කියත සමග ඉරුම් පට්ටල් 01 යි |
| 92. | අංක රහිත | රබර් බට තොගයක් |
| 93. | -එම- | චින්තා පැදුරු තොගයක් |
| 94. | 78332 | වඩු ආයුධ මලු 01 යි |
| 95. | අංක රහිත | වේ වැල් කුඩා තොගයක් |
| 96. | -එම- | යකඩ අලවංගු 03 යි |
| 97. | -එම- | යකඩ බාල්දි තොගයක් |
| 98. | -එම- | තෙල් ඉසින යන්ත්‍ර 01 යි |
| 99. | -එම- | උදලු තොගයක් |
| 100. | -එම- | ඇඳන් 01 යි |
| 101. | -එම- | කැඩී ගිය පුටු සහ ලී බඩුවල කොටස් තොගයක් |

06-493

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

එක්සත් රාජධානිය එල්. ඊ. 4. 9. ජී. ජී. ලෙස්ටර් හන්ටිංක්ටන් රෝඩ් 25 හි පදිංචි පල්ලේගමයලාගේ බේබිනෝනා වන මම අංක 723 හා 2002.01.31 දින දරන ටී. ඊ. සිරිපාල ජයතිලක නොතාරිස් තැන ලියා සහතික කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මත මාගේ ඇටර්නි බලකරු වශයෙන් ජාතික හැඳුනුම්පත් අංක 790551036 V හිමි සෙනෙවිරත්නලාගේ සතිස් අත්ජන ජයතිලක යන අයට ලබාදුන් ඇටර්නි බලය අද දින සිට අවලංගු කරන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

06-561

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

දැනට ශ්‍රී ලංකාවේ වැල්ලම්පිටිය, කොටුවිල, අංක 357/බී හි පදිංචි කතලුව ලියනගේ ඉන්ටන් සුජීව වන මම මහජනයා වෙත සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට දන්වා සිටින වගනම්, කතලුව ලියනගේ බුද්ධික සංජීව යන අයට බලය පවරන ලද, පියතිලක ගවරම්මාන නොතාරිස් මහතා විසින් ලියා සහතික කරන ලද අංක 874 හා 2005 ජූනි 07 වැනි දින දරන හා ශ්‍රී ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ බාණ්ඩය 302 පත්‍රිකාව 149 හි ලියාපදිංචි කරන ලද ඇටර්නි බලපත්‍රය අද දින සිට එනම් 2006.06.07 දින සිට අවලංගු සහ බලරහිත වන බවද, එම දිනෙන් පසු ඔහු විසින් ඇතුලත්වනු ලබන කිසිදු ගණුදෙනුවක බලපැවැත්මක් නොමැති බවද ඒවාට මාගේ වගකීමක් නොමැති බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

කතලුව ලියනගේ ඉන්ටන් සුජීව.

06-569

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ.5/1746/කේවයි2/044-5/69703/ඩී5/681.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.01.20 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.05.26 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 මහානාම ඩ්‍රයිව් හි බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.07.22 වැනි දින මධ්‍යහන 12.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ මහ නගර සභා සීමාවන් තුළ වරිපනම් අංක 46 දරන ස්ථානයේ පිහිටි මොයිස් ක්‍රෙසන්ට් නිවාස යෝජනා ක්‍රමයේ කොටසක් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. කුමාරසාමි විසින් සැකසුණු 1977.08.10 දින හා අංක 7349/103 දරන පිඹුරේ කැබලි අංක 103 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 7.25ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ. මෙම ඉඩම් කොටස මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 52/76 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 09 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-645/18

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 17/55148/ඩී17/096.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.06.20 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.09.13 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 මහානාම ඩ්‍රයිව් හි බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.07.22 වැනි දින පස්වරු 4.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, හුරුළුවැව ආදායම් නිලධාරී කොට්ඨාසයේ අංක 39 ග්‍රාම සේවා කොට්ඨාසයේ පහළ නිට්ටැවේ පිහිටි ගොඩ ඉඩම නැමැති ඉඩමේ සර්වේයර් ජනරාල්වරයා විසින් සැකසුණු 1971.02.13 දින හා අංක අ. ග. පි. 1418 දරන පිඹුරේ කැබලි අංක 92 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 3, පර්. 10ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ස්. හු. 49/177 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, කැබලි අංක 50, 90 2/2, 82 2/2, 85 2/2, 49, 101 2/2, 26 1/2, 126 2/2, 52 2/2, 58 2/2, 139, 136, 143 2/2 සහ 139 යන බිම් කොටස් මතින් දැක්වෙන මාර්ග අයිතීන්ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 09 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-645/17

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/43580/සීඩී7/236.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.07.25 දින *ගැසට් පත්‍රයේ* සහ 2003.08.23වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව් හි අංක 474 බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.07.20 වැනි දින පෙරවරු 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව මහ නගර සභා සීමාවන් තුළ මොරටුව කොරළවැල්ල පිහිටි මාදංගහවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. ඩබ්ලිව්. රුදිගු විසින් සැකසුණු 2001.06.02 දින හා අංක 2504 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0 පර්. 11.56ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එම් 2557/196 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඉහත කී ඉඩම බලයලත් මිනින්දෝරු එච්. එම්. කුරේ විසින් සැකසුනු 1985.07.12 දින හා අංක 4798 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක ඒ හි අනු බෙදුමකි.

තවද, 1965.10.28 දින හා අංක 1703 දරන පිඹුරේ කැබලි අංක 5, 6 සහ 3 දරන බිම් කොටස් සහ අංක 432 දරන පිඹුරේ කැබලි අංක ඩී දරන බිම් කොටස් මතින් හිමි මාර්ග අයිතීන් සහ අනෙකුත් අයිතීන් ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරි.*

2006 ජුනි මස 09 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-645/15

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 5/73153/ඩී5/711.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.09.17 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.02.04 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 මහානාම ඩ්‍රයිව් හි බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.07.22 වැනි දින පෙරවරු 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මාතලේ, දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශිය සභා සීමාවන් තුළ මාතලේ, උතුර කොස්පොත ග්‍රාමයේ පිහිට වලහඳපිටියෙ යාය, මහකලගස්යාය සහ කුඩා කලගස්යාය නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. සිරිපාල විසින් සැකසුනු 1994.08.06 දින හා අංක 91 දරන පිඹුරේ කැබැලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 4, රූ. 1, පර්. 8 ක්වූ බෙදා වෙන් කරන බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 346/212 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, ඉහත කී අංක 91 දරන පිඹුරේ දැක්වෙන මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරි.*

2006 ජුනි මස 09 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-645/14

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/5/1656/කේවයි2/318.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

2005.07.01 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.10.03 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 මහානාම ඩ්‍රයිව් හි බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.07.22 වැනි දින පස්වරු 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

මාතලේ, දිස්ත්‍රික්කයේ, ඉනාමළුව ග්‍රාමයෙහි පිහිටි රොටරිගම නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. එම්. ජයසේකර විසින් සැකසුණු 1996.02.14 වැනි දින හා අංක 2108 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 1, රූ. 1, පර්. 21.3ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 33/197 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 2108 දරන පිඹුරේ දැක්වෙන මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 09 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-645/12

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/30609/සීඩී1/572.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.09.16 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.10.24 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 මහානාම ඩ්‍රයිව් හි බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.07.20 වැනි දින පෙරවරු 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ඕවිටිගම පිහිටි පරගහලන්ද, නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. ජේ.නානායක්කාර විසින් සැකසුණු 1983.01.24 දින හා අංක 2416 දරන පිඹුරේ කැබලි අංක 6 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 10.5ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එන් 120/278, එන් 153/185 සහ එන් 161/178 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, බලයලත් මිනින්දෝරු එන්. ඩී. සිරිසේන විසින් සැකසුනු 1979.09.15 දින හා අංක 3675 දරන පිඹුරේ කැබලි අංක "ඩී" මතින් ඇති මාර්ග අයිතිය සහ ඉහත කී අංක 2416 දරන පිඹුරේ කැබලි අංක "ඒ" මතින් ඇති මාර්ග අයිතියද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 09 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-645/19

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ3/2307කේවයි2/552.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002.06.28 දින *ගැසට් පත්‍රයේ* සහ 2003.01.13 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, මීගමුව, ප්‍රනාන්දු මාවත, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.07.29 වැනි දින පස්වරු 1.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල පිහිටි එගොඩකොටුවෙවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සැකසුනු 1997.01.20 දින හා අංක 1539 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන්

අ. 0, රූ. 0, පර්. 22ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 948/26 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූනි මස 09 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-645/16

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 2/60564/එන්2/744.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.02.03 දින *ගැසට් පත්‍රයේ* සහ 2006.04.17 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, මීගමුව, ප්‍රනාන්දු මාවත, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.07.29 වැනි දින පෙරවරු 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ මීරිගම ආදායම් පාලක කොට්ඨාස සීමාවන් තුළ 28 ඒ වැල්ලිවිලමුල්ල ග්‍රාම සේවක කොට්ඨාසයේ කල්එළිය පිහිටි හංසගිරියවත්ත නැමැති ඉඩමේ සර්වේයර් ජනරාල්වරයා විසින් සැකසුනු අංක 1619 දරන මිනුම් පිඹුරේ සහ එෆ් එස් අංක එල් 2/78 හි කැබලි අංක 94 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 36ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 253/73 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී පිඹුරේ දැක්වෙන මාර්ග අයිතීන් ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූනි මස 09 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-645/13

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 18/74917/ඩබ්ලිව්18/144.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.08.18 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.11.01 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කුරුණෑගල මල්කඩුවාව වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජේතිලක විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.07.27 වැනි දින පෙරවරු 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හල්මිල්ලගොල්ල ග්‍රාමයේ පිහිටි දඹගහමුලවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. ජේ. ඩී. අයි. සිරිවර්ධන විසින් සැකසුණු 1998.01.28 දින හා අංක 98/29 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 2, පර්. 5.2ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 779/101 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූනි මස 09 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-645/11

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 3/73080/ඩී3/985.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

2005.10.28 දින *ගැසට් පත්‍රයේ* සහ 2006.01.03 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පන්නිපිටිය, හයිලෙවල් පාරේ, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.07.13 වැනි දින පෙරවරු 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කඩදර පිහිටි කිරිගල පල්ලේවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. ඒ. ආර්. ආනන්ද විසින් සැකසුණු 2001.02.09 දින හා අංක 1681 ඒ දරන පිඹුරේ කැබලි අංක 2 ඒ සහ 2 බී ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ.0, රූ. 0 පර්. 10.75 (වඩාත් නිවැරදිව පිළිවෙළින් අ. 0, රූ. 0, පර්. 10.75ක් සහ අ. 0 රූ. 01 පර්. 35.5) ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස් සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එස්. 147/205 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 ජූනි මස 09 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-645/10

---

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව – ජාඇල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සහන් දේපල 2006ක් වූ ජූලි මස 13 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ රාගම පත්තුවේ, දකුණු බටගම පිහිටි "කොස්ගහවත්ත" නමින් හඳුන්වන ලබන ඉඩමට බලයලත් මානක ආර්. යූ. විජේතුංග විසින් මැන සාදන ලද 2000.01.07 දිනැති අංක 583/2000 දරන පිඹුරෙන් බෙදා වෙන් කරනු ලැබූ ලොට් 1 ලෙස නිරූපිත ඉඩම් කොටස.

විශාලත්වය පර්චස් 22.26යි

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩී. අල්විස් විසින් සහතික කරන ලද්දාවූ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද, 2004.03.03 වැනි දිනැති සහ අංක 1038 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සුහසිංහ ආරච්චිගේ වසන්ත රෝහිත සුහසිංහ ණයකරු හැටියට පැහැර හැර ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.03.10 දින දරන රජයේ *ගැසට්* පත්‍රය සහ 2006.03.23 වැනි දින දරන අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

1. ගැණුම් මිලෙන් 10%ක් ද, (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000,
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
6. සියලුම ප්‍රචාරක වියදම් ද.

ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූව) විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත දී සී/ස හැටන් නැෂනල් බැංකුවට ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. කළමණාකරු - ජාඇල ශාඛාව, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, දුරකථන අංක 4833348 හෝ ප්‍රධාන කළමණාකරු (ණය අධීක්ෂණ හා අයකිරීමේ දෙපාර්තමේන්තුව) සීමාසහිත හැටන් නැෂනල් බැංකුව අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661815, 2661816.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
සහ බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංක : 2863121.

06-593

---

### මහජන බැංකුව – ආයතනික 1 අයකිරීම්

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

යං ඉන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් කලින් කේබී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් හඳුන්වන ලදී. දැනට කේඑල් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් හඳුන්වනු ලබයි.

බස්නාහිර පළාත, මීගමුව ලියාපදිංචි කොට්ඨාසය තුළ ගම්පහ දිස්ත්‍රික්කය අළුත්කුරු කෝරළේ උතුර (ඒ) දුන්ගහ පත්තු බඩල්ගම හා දෙල්පාකඩවර

ග්‍රාමයන්හි පිහිටි බඩල්ගම එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු එච්. ඩී. රූපසිංහ විසින් සාදන ලද 1993.5.24 දින හා 284 ඒ දරන පිඹුරේ ලොට් 2 වශයෙන් නිරූපිත බෙදා වෙන් කළ ඉඩම් කොටස.

ඉඩම ප්‍රමාණයෙන් - අක්කර 9, රූඩ් 0, පර්. 12.8
(එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි යන්ත්‍ර උපකරණ හා සියලු දේ ද සමග)

ඉහත කී ස්ථානයේ සවිකර ඇති පහත සඳහන් යන්ත්‍ර ද සමග ජෙනරේටර් වෝල්වෝ පෙන්ටා 500 **KVA** විදුලි නිෂ්පාදන සෙට් මොඩල් **TAD** 1631 **GE** සමග ස්ටේම්ෆෝඩ් ඕල්ටරේටර් ජෙනරේටර් සම්බන්ධ කර ඇත.

තවද පහත සඳහන් ඉඩම් කොටසේ මාර්ග අයිතිය ද සමග බස්නාහිර පළාතේ මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ උතුර (ඒ) දුනගහ පත්තු බඩල්ගම හා දෙල්පා කඩවර ග්‍රාමයන්හි පිහිටි බඩල්ගම එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු එච්. ඩී. රූපසිංහ විසින් සාදන ලද 1993.05.24 දින හා 284ඒ අංක දරන පිඹුරේ ලොට් 04 (මාර්ග සඳහා වෙන් කරන ලදි) වශයෙන් නිරූපිත බෙදා වෙන් කළ ඉඩම් කොටස.

ඉඩම ප්‍රමාණයෙන් - අක්කර 0, රූඩ්. 0, පර්. 14.2

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලතල අනුව 2006 ජූලි 15 සෙනසුරාදා පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය 2005.02.18 දින දරන රජයේ *ගැසට්* පත්‍රයද, 2005.02.02 දින දරන ඩේලි නිවුස්, දිනමිණ හා තිනකරන් පුවත්පත්ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– මිල තීන්දුවනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පලාත් අධිකාරියට ගෙවිය යුතු බද්ද පළාත් අධිකාරි බද්ද ගැණුම් මිලෙන් 1%ක්,
3. 2 1/2%ක් වන (සියයට දෙකහමාරක් වන) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. විකිණීමේ පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තුව.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ගාස්තුව වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත, කොළඹ 02, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, 10 වැනි මහල, මහජන බැංකුව, කෝපරේට් 1 රිකවරීස් ප්‍රධාන කළමණාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක :2334265, 2481604, 2481430,
ෆැක්ස් අංකය :2481605

හිමිකම් ඔප්පු සහ වෙනත් විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය. ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත මුදල් ගෙවනු නොලැබුවේ නම් ගැණුම් මිලෙන් දැනටමත් ගෙවා ඇති 10% (සියයට දහය) අහිමි කොට දේපල නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුය.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ .

| | |
|---|---|
| *ප්‍රධාන කාර්යාලය :* | *නගර කාර්යාලය :* |
| අංක 24, ටොරින්ටන් පාර, | අංක 55 ඒ, ධර්මපාල මාවත, |
| මහනුවර. | කොළඹ 03. |
| දුරකථන අංක :081-2227593 | දුරකථන අංක :2441761 |
| දුරකථන/ෆැක්ස් :081-2224371 | ෆැක්ස් අංක :2448526 |
| | ඊ මේල් : samera@sri.lanka.net |

06-594

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් –කඩවත ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මානක ඩී. සී. කොතලාවල විසින් 1989 අගෝස්තු මස 19 වන දින සාදන ලද අංක 108/89ඒ දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අධිකාරිපත්තු සියනෑ කෝරළේ ගෝනහේන පිහිටි ගෝනහේන වතුයාය ඉඩමේ ලොට් 5 දරන පර්චස් එකොලහයි දශම නවයයි හතරක් (අක්කර 0, රූ.0, පර්චස් 11.94) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ ඇති සියළු දේ සමග වේ.

ඉහත කී අංක 108/89ඒ දරන පිඹුර පරිදි එකී ගෝනහේන වතුයාය ඉඩමේ (පාරක් සඳහා වෙන්කොට ඇති) ලොට් 11 දරන පර්චස් විස්සයි දශම පහයි එකක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 20.51) විශාල ඉඩම සහ ඒ තුල පිහිටි සියළු දේත් සමග වේ.

හිතිදුම ලියනගේ ධර්මපාල ණයකරු හැටියට ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ,

වර්ෂ 2006ක් වූ ජූලි මස 18 වන දින පෙරවරු 11.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.01.27 වන දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2006.01.30 වන දින ලංකාදීප, අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත්ද බලන්න. විකිනීම පිළිබඳ දැන්වීම සඳහා 2006.06.23 වන දින රජයේ *ගැසට් පත්‍රයද*, ලංකාදීප, අයිලන්ඩ් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.*– කඩවත කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් අසලින් ඇති ශ්‍රී ප්‍රේමානන්ද මාවතේ කිලෝ මීටර් 2.7ක් ගොස් දකුණු පසින් ඇති ගෝනහේන මාවරමණ්ඩිය නමැති පාරේ කිලෝ මීටර් 600ක් පමණ ගියවිට රෝයල් මූව් කලෙක්ෂන් ඉදිරිපස පිහිටා ඇති ගුරු පාරේ කිලෝ මීටර් 100ක් ගොස් වමට හැරී, මීටර් 6.1 ක් පමණ පළල ගුරු පාරක මීටර් 400ක් පමණ ගිය විට අදාළ දේපල වම් පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– විකිනීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%)
02. පලාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%)
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැනුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. නොතාරිස් ගාස්තු රු. 2,000
05. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500
06. වෙන්දේසිය සඳහා වැයකරන ලද සියළුම ප්‍රචාරක වියදම්
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන ශාඛාවේ හෝ කඩවත ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක - සාම විනිසුරු,
බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්,
කොළඹ වාණිජ මහාධිකරණය සහ
දිසා අධිකරණය, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
රාජ්‍ය බැංකු සහ වාණිජ බැංකු
අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් - 2445393.

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,
අංක 143/ බී, නුවර පාර,
කඩවත.
දුරකථන අංක : 2921456 - 7
2921454
ෆැක්ස් අංකය : 2921455.

06-579

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව – ගම්පහ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

### අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියනලද්දා වූ ද 2001.01.23 දින අංක 19186 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලොකු බාලසූරියගේ සිරිසේන සහ නාරානපිටි හභවත්ත අප්පුහාමිලාගේ රූපානි නොහොත් රන්ජනී ජයලත් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින් මා වෙත පවරන ලද බලතල යටතේ අයවිය යුතු ණය මුදල් ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කරන ලද දේපල වර්ෂ 2006ක් වූ ජූලි මස 12 වැනි දින පෙ. ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුව නැදගමුවේ පිහිටි බෝගහවත්ත හෙවත් කොස්ගහවත්ත නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක කේ. ඒ. පී. කස්තුරිරත්න විසින් සාදන ලද 1984.02.25 දින අංක 1521 පිඹුරෙන් බෙදාවෙන් කළ ලොට් 3 දරන ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේත් සමග වේ.

පිඹුරු අංක 1521 න් පෙන්වා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

විශාලත්වය ලොට් 3 - පර්චස් 34.2 යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.02.10 දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2006.02.14 දිවයින, අයිලන්ඩ් සහ තිනකරන් යන පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසීම.*– ගම්පහ උඩුගම්පල හරහා කොටුගොඩ සීදූව මාර්ගයේ නැදගමුව උප තැපැල් කාර්යාලය සහ ලක්මාලි ට්‍රේඩර්ස් ව්‍යාපාරය අතර මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), ප්‍රාදේශීය සභා අයබදු වශයෙන් සියයට එකක් (1%), වෙන්දේසිකරුගේ කොමිස් මුදල් සියයට දෙකහමාරක් (2 1/2%), නොතාරිස් සහ විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ ගාස්තු රු. 2,000, ලිපිකරු හා සෝෂක වේතන රු. 500 සහ සියලු ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරි මුදල වෙන්දේසියේ දින සිට දින 30ක් ඇතුළත කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 සී/ස හැටන් නැෂනල් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ ජොෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ හා ආපසු අයකරගැනීම්) වෙත ගෙවිය යුතුය. දුරකථන අංක 2661815, 2661819. දින 30ක් ඇතුලත ඉතිරි මුදල් නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිළන් ගෙවා ඇති 10% ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ ගම්පහ ශාඛාවෙන් (දුරකථන අංක 0334 - 670189) හෝ ඉහත ලිපිනයේ ප්‍රධාන කාර්යාලයේ නීති නිලධාරී වෙතින් ලබාගත හැකිය.

එන්. එච්. පී. ආරියරත්න,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
අලුත්කඩේ, කොළඹ 12.
දුරකථන අංක 077-3281956

06-603

---

## ලංකා බැංකුව

### ලංකා බැංකුව ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය 831110.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.01.06 දිනැති අංක 1427 දරන *ගැසට් පත්‍රයේ* හා 2006.01.02 දිනැති ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂයද, විකිනීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදී ම 2006.07.22 වැනි දින පෙ. ව. 10.30 ට අංක 134, බැද්දගාන පාර කෝට්ටේ පදිංචි වෙන්දේසිකාර පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරලේ, කුඹුකපත්තුව හි හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ කුඹුක හි පිහිටියාවූ ද, පිටවලලන්ද (ටීජී 138161) නැමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්. අබේසිංහ විසින් සාදන ලද 1992 පෙබරවාරි මස 17 දිනැති අංක 4110 දරන පිඹුරේ විස්තර කළ ලොට් 11 බී වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ ද නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට ලොට් 11 ඒ ද, නැගෙනහිරට ලොට් 11 සී ද, දකුණට අංක 575 දරන පිඹුරේ ලොට් 10 ද, බස්නාහිරට ගම්සභා පාර ද, මායිම්ව එකී අංක 4110 දරන පිඹුර අනුව පර්චස් විසිඅටයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 28.5) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොළ වැවිලි ගොඩනැගිලි සහ සියලු දේ වේ. මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 113/191 හි ලියාපදිංචි කර ඇත.

බී. ආර්. කුලරත්න,
කළමනාකරු.

ලංකා බැංකුව,
හොරණ ශාඛාව.

06-632

---

## මහජන බැංකුව – පේරාදෙණිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මධ්‍යම පළාත, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟ පළාත කෝරළේ ඒදඬුවාව නොහොත් අන්දන්ගම පිහිටි බෝගහමූලවත්ත නැතහොත් ඒදඬුවාවට යන පාරේ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. සී. ඕ ද ලා මොට් මහතා 1967.07.06 දින මැන සැකසූ අංක 3335 පිඹුරේ කැබලි අංක 07 වශයෙන් දැක්වෙන පර්චස් පහක් (අක්. 0 රූ. 0 පර්. 05) විශාල ඉඩම සහ එහි පිහිටි තෙමහල් ගොඩනැගිල්ල ද, එකී පිඹුරේ කැබලි අංක 10 දරන පර්චස් තුනක් විශාල ඉඩමෙහි ලිඳෙන් දිය ගැනීමේ අයිතිය ද මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය මත අප විසින් 2006.08.17 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2002.10.18 වැනි දින ද දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් යන පුවත්පත්වල 2002.10.10 වැනි දින ද පළකර ඇති දේපල වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*– කොළඹ නුවර පාරේ පේරාදෙණිය නගරයේ සිට සැතපුමක් පමණ ගිය විට පාරේ වම් පසින් (නිව් රත්න ස්ටෝර්ස්) ඉහත දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක් ද,
2. පලාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුකේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත මහජන බැංකුව මහනුවර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය :081- 2234283
ෆැක්ස් අංකය :081-2223017

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැකිය. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ශොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බලයලත් වෙන්දේසිකරුවෝ,
(රාජ්‍ය හා පෞද්ගලික බැංකුකරුවන් වෙනුවෙන්
සහ උසාවි කොමසාරිස්වරු)

| *ප්‍රධාන කාර්යාලය* : | *නගර කාර්යාලය* : |
|---|---|
| අංක 24 | අංක 55ඒ |
| ටොරින්ටන් පාර, | ධර්මපාල මාවත, |
| මහනුවර | කොළඹ 03. |
| දුරකථන : 081-2224371 | 011-2448526, 011-2441761 |
| 2227593 | 011-2448526 |
| ෆැක්ස් : 081-2224371 | ඊ මේල් : samera@sri.lanka.net |

06-631

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - කොල්ලුපිටිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පදිංචියට ව්‍යාපාරයකට සුදුසු දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පොල නගර සභා සීමාවන් තුළ ගම්පොල නාවලපිටිය මහා මාර්ගයට මායිම්ව බෝවතුර ගංවතුර සහන යෝජනා ක්‍රමයේ 3 වන පටුමගේ පිහිටි මරියවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කළ කොටසක් හා එහි තුළ පිහිටි සියලු දේ ඉඩමේ ප්‍රමාණය - පර්චස් 6.03.

මෙම දේපල සහබ්දීන් මෙහොමඩ් ෆාරූස් යන අය බන්ධනදායී ලෙසට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2006ක් වූ ජූලි මස 18 වැනි දින ප. ව. 2.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 1998.10.23 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 1998.10.06 වැනි දින දිණමින, ඩේලිනිව්ස්, තිනකරන් යන පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*– ගම්පොල සිට නාවලපිටිය පාරේ සැතපුම් 1/2ක් පමණ ගමන් කළ විට හමුවන නිවාස යෝජනා ක්‍රමය ඉදිරිපිටින් නාවලපිටිය පාරට මායිම්ව කඩකාමර දෙකකට මැදින් පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

ගැණුම් මිළෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි) වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයට හෝ කොල්ලුපිටිය ශාඛාව වෙත ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. කළමණාකරු කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් අංක 285, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2577280, 2573546, 2577281.
ෆැක්ස් අංකය : 011-2575448

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,
වටපුළුව,
මහනුවර.

දුරකථන අංක : 081-2211025,
071-4755974,
071-4213497,
071-2755974
ෆැක්ස් අංකය : 081-2211025.

06-622/2

## කොළඹ දිසා අධිකරණයේ දී ය

වෙක්දේසියේ විකිණීමයි

නඩු අංකය 16080/එම්. බී.

කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ, අංක 57 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තාවූ කොළඹ 01, බ්‍රිස්ටල් වීදියේ, අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්.

පැමිණිලිකරු.............

එදිරිව

කොළඹ 12, අළුත්කඩේ, අංක 93 දරන ස්ථානයේ ඩෙන්වොනල් එක්ස්පෝ ලිමිටඩ්.

දැනට
අංක 87, නුගගහ පාර,
කටුනායක

විත්තිකරු..............

ඉහත අංක දරන නඩුවේ වාර්තාවේ ඇතුලත් කර ඇති වර්ෂ 1991 ක් වූ ඔක්තෝබර් මස 09 වැනි දිනැති තීන්දු ප්‍රකාශය (සහතික පිටපත් මෙයට අමුණා ඇත) මගින් රුපියල් හාරලක්ෂ අනූ තුන්දහස් හත්සිය හැට එකයි ශත අසූ තුන (රු. 493,761.83) ක මුදලක් 1991 ක් වූ ඔක්තෝබර් මස 09 වැනි දින තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වර්ෂයකට (24%) බැගින් පොලිය ද, එතැන් සිට තීන්දු ප්‍රකාශිත මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් සමස්ථ මුදල සඳහා පොලිය ද, නඩු ගාස්තු ද, ඒ සඳහා තව දුරටත් පොලිය හා ගාස්තු ද අයකර ගැනීම සඳහා මා වෙත එකී අධිකරණයෙන් නිකුත් කර ඇති අධිකාරී පත්‍රය අනුව ඉහත නම් සඳහන් විත්තිකරුට අයත්, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල, වර්ෂ 2006ක් වූ ජුනි මස 26 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, කටුනායක නගර සභා සීමාව ඇතුළත කටුනායක පිහිටි ගොරකගහවත්ත නමැති ඉඩමේ "සී" කැබැල්ල වශයෙන් බලයලත් මිනින්දෝරු තැන්පත් කේ. විජයරත්නම් විසින් සාදනු ලබන මීගමුව දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 644/196 හි ලියාපදිංචි කර ඇති අංක 3/1982 සහ 1982 ජනවාරි මස 15 වැනි දින දරන සැලැස්ම අනුව ඊට මායිම්, උතුරට: එම සැලැස්මේ දැක්වෙන මෙම ඉඩමේ ම ඩී බිම් කැබැල්ල, අඩි 10 පළල පාරට වෙන් වූ කොටසද, නැගෙනහිරට: මෙම සැලැස්මේ ම දැක්වෙන එම ඉඩමේ ම බී බිම් කැබැල්ල, දකුණට: කේ. ඇලිස් සිල්වාගේ සහ වෙනත් අයගේ ඉඩම් සහ බස්නාහිරට: නුගගහ පාර යන එකී මායිම්

ඇතුලත එහි වපසරිය පර්චස් විස්සයි (අ. 0 රූ. 0 පර්. 20) හෙවත් හෙක්ටයාර් (0.0505857) කි.

*දේපලට පිවිසීම.*– කොළඹ මීගමුව පාරේ, කටුනායක ගුවන් තොටුපල, හන්දිය පසුකර මීටර් 24 කණුව පසුකර යාර 20ක් පමණ ඉදිරියට ගිය විට දකුණු අතට නුගගහ පාර ඇත, එම පාරේ යාර 200ක් පමණ ඉදිරියට ගිය විට වංගුවක් හමුවේ. එම වංගුව සමගම වම් අත පැත්තට ඇති පාරේ පළමුවන නිවස වේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් සියයට විසි පහක් ද, අධිකරණයෙන් අනුමත කර ඇති ගාස්තු චක්‍රය අනුව වෙන්දේසිකරුගේ ගාස්තුව ද, රජයේ ගාස්තු ද, වෙන්දේසිය සඳහා වූ සියලුම වියදම් ද, එවෙලේ ම වෙන්දේසිකරුට ගෙවිය යුතුය. තව ද, ගැණුම් මිලෙන් ඉතිරි මුදල දින තිහක් (30) ඇතුලත අධිකරණයේ තැන්පත් කළ යුතුය.

වැඩි විස්තර සඳහා කළමනාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01, අංක 21.

ඉන්දු හේවාවිතාරණ,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
වෙන්දේසිකරු, සාම විනිසුරු.

අංක එච් - 1/16, සාංචිආරච්චි වත්ත,
කොළඹ 12.
දුරකථන අංක : 0777-178182, 077-3186624.

06-652

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.